© සියලුම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය

## අන්තර්මධ්‍ය අදියර

## 2010 මාර්තු විභාගය

විභාග දිනය : 2010 අප්‍රේල් 04 පිටු ගණන : 03
විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 ප්‍රශ්න ගණන : 07

අයදුම්කරුවන්ට උපදෙස්:

1. නියමිත කාලය පැය 3 කි.
2. ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| ව්‍යාපාර හා සමාගම් නීතිය | (BCL / 604) |

---

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 20)*

(a) පියල් රු. 50,000/- ක් සඳහා චෙක්පතක් කමල් වෙනුවෙන් නිකුත් කරන ලදී. සරත් නැමති අය විසින් කමල්ගේ ගබඩාවේ රු. 50,000/- ක මුදලකට තීන්ත ගෑමට එකඟ වී ඇති හෙයින් කමල් විසින් එම චෙක්පත සරත්ට පවරන ලදී. චෙක්පත ලැබීමෙන් පසු සරත් එකඟ වූ පරිදි ගබඩාවේ වෙත තීන්ත ගෑම නිමකරන ලදී. චෙක්පතට අදාළ මුදල් ලබාගැනීමට ගිය විට අවශ්‍ය මුදල් නොමැතිකම නිසා එම චෙක්පත අගරු විය.

විනිමය බිල්පත් සම්බන්ධයෙන් හා අගනා ප්‍රතිශ්ඨාව පිළිබඳව නීතිරීතිවලට අදාළව මෙම මුදල් ගෙවීම් සඳහා පියල්ට හෝ කමල්ට එරෙහිව සරත්ට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත හැකි ද, යන්න පැහැදිලි කරන්න. **(ලකුණු 06)**

පහත සඳහන් අවස්ථාවල දී ඔබේ පිළිතුර වෙනස් වේද?

(i) සරත් රු. 50,000/- ක පොරොන්දුවක් මත දැනටමත් කමල්ගේ ගබඩාවේ තීන්ත ගෑම අවසන් කර ඇති අතර වැඩ අවසන් වීමෙන් පසු රු. 50,000/- ක වටිනාකමින් යුත් චෙක්පත කමල් සරත්ට පවරන ලදී. **(ලකුණු 03)**

(ii) කමල් නිවාඩු ලබා සිටිය දී ඔහුගේ අසල්වැසි සරත් ස්වකීය කැමැත්තෙන්ම කමල්ගේ ගෙමිදුලේ ඇති තණකොළ පියස පවිත්‍ර කරන ලදී. කමල් ආපසු පැමිණි පසු සරත්ට මෙසේ පැවසීය. ''ඔබ මගේ ගෙමිදුලේ ඇති තණකොළ පියස පවිත්‍ර කිරීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව වශයෙන් රු. 5,000/- ක චෙක්පත තබා ගන්න.' **(ලකුණු 03)**

(b) ඩේවිඩ් ත්‍යාගයක් වශයෙන් බින්දු වෙනුවෙන් චෙක්පතක් නිකුත් කරයි. බින්දු මෙම චෙක්පත චමල්ට ත්‍යාගයක් වශයෙන් පිටසන් කරයි. චමල් එම චෙක්පත වටිනාකමක් ලැබීම නිසා මාලාට පිටසන් කරයි. මාලා එම චෙක්පත එමාට ත්‍යාගයක් වශයෙන් පිටසන් කරයි.

මෙම චෙක්පත අගරු වූයේ නම් කවරකු විසින් කවරෙකුට එරෙහිව නීතිමය පියවර ගත හැකි ද? **(ලකුණු 08)**
**(මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 02</u>** *<u>(ලකුණු 20)</u>*

(a) පහත සඳහන් පද නිර්වචනය කරන්න.

(i) ශූන්‍ය (void) හා අවලංගු කළ හැකි (voidable) ගිවිසුම්

(ii) නීති විරෝධී ගිවිසුමක් (illegal) **(ලකුණු 08)**

(b) බාලවයස්කරුවකු වූ මහින්ද ඔහු අවුරුදු 20 ක අයෙකු බව වංචනිකව වරදවා දැක්වීමෙන් ණයට මුදල් දෙනු ලබන අයෙකු වූ ලාල්ගෙන්, රු. 10,000/- ක් ණයට ලබාගෙන ඇත.

මහින්ද ගෙවීම පැහැර හැරියහොත් මුදල් නැවත අයකරගැනීම සඳහා නඩු පැවරිය හැකි ද? පැහැදිලි කරන්න.

ලාල් මෙම මුදල මහින්දට ඔහුගේ අධ්‍යාපන වියදම් සඳහා දී ඇත්නම් ඔබේ පිළිතුර වෙනස් වේද? පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

**(මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 03</u>** *<u>(ලකුණු 20)</u>*

(a) ''මිල නොලත් විකුණුම්කරු'' යන පදයේ තේරුම කෙටියෙන් පැහැදිලි කොට භාණ්ඩවලට හා ගැනුම්කරුට එරෙහිව පවතින අයිතිවාසිකම් දක්වන්න. **(ලකුණු 10)**

(b) විලියම් මෝටර් කාර් රථයක්, මෝටර් කාර් විකුණනු ලබන අයෙකු වූ ප්‍රනාන්දුගෙන් මිල දී ගත්තේ ය. මෙම වාහනය ඔහු මාස 2 ක් පාවිච්චි කළේ ය. මෙම වාහනය මාස 6 කට පෙර සොරකම් කළ එකක් බව ඔහුට පොලීසියෙන් දැන්වීය. නීත්‍යානුකූල අයිතිකරු වූ රනිල් මෙම වාහනය විලියම්ගෙන් ආපසු ලබාගැනීමට අදහස් කරයි.

විලියම්ගේ අයිතිවාසිකම් පැහැදිලි කරන්න. **(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 04</u>** *<u>(ලකුණු 20)</u>*

(a) සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම පිළිබඳ සමාගමක අයිතිවාසිකම් පරීක්ෂා කරන්න. **(ලකුණු 06)**

(b) කොටස්හිමියෙකුට සමාගමක කොටස් අයිතිය නිසා ලැබෙන අයිතිවාසිකම් කෙටියෙන් සඳහන් කරන්න. **(ලකුණු 14)**

**(මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 05</u>** *<u>(ලකුණු 20)</u>*

(a) සමාගමක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්කිරීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් නොලබන පුද්ගලයන් සඳහන් කරන්න. **(ලකුණු 08)**

(b) 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදන අනුව ''අධ්‍යක්ෂකවරුන් වීමට නුසුදුසුකම්'' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? **(ලකුණු 12)**

**(මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 06</u>** *<u>(ලකුණු 20)</u>*

(a) නිහාල් විසින් ඔහුගේ නිවස විකුණාගැනීම සඳහා ඔහුගේ නියෝජිත ලෙස කුමාර පත්කරන ලදී. කුමාර එම නිවස නොදන්නා අයෙකු වූ විපුලට විකුණන ලදී. කුමාර විපුලගෙන් කොමිස් මුදලක් ලබාගෙන ඇත.

නිහාල්ගේ අයිතිවාසිකම් හා කුමාරගේ වගකීම් පිළිබඳව කරුණු දක්වන්න. **(ලකුණු 10)**

(b) නියෝජ්‍යත්ව නීතිය අනුව අපරානුමතික සංකල්පය සැලකිල්ලට ගෙන පසුව අනුමත කිරීම ක්‍රියාත්මක වීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි දක්වන්න. **(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 07</u>** *<u>(ලකුණු 20)</u>*

වෙස්කෝ පොදු සමාගම 2009 වර්ෂයේ දී සංස්ථාගත කරන ලදී. 2007 අංක 7 දරණ සමාගමන් පනතේ ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන පහත සඳහන් අවස්ථාවන් යටතේ ඔබේ පිළිතුර සඳහා කරුණු දක්වමින් නීත්‍යානුකුලත්වය පැහැදිලි කරන්න.

(a) වෙස්කෝ පොදු සමාගම අධ්‍යක්ෂවරු කිහිප දෙනෙකු සාමාන්‍ය යෝජනාවකින් මහා සභා රැස්වීමක දී පත්කිරීමට අදහස් කරයි. **(ලකුණු 08)**

(b) සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස ප්‍රනාන්දු පත් කළේ ය. ප්‍රනාන්දුට අවුරුදු 70 සම්පූර්ණ වන විට අධ්‍යක්ෂවරයකු ලෙස වර්ෂ 3ක් සේවය කර ඇත. **(ලකුණු 12)**

**(මුළු ලකුණු 20)**

*ප්‍රශ්න පත්‍රය අවසානයි*